**කොන්දේසි**

1. අයදුම්පත්‍රයේ සඳහන් සේවා සැපයීම සඳහා ලියාපදිංචි කරන ලද ව්‍යාපාරයක් වීම.
2. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගරාජයක් වීම අමතර සුදුසුකමක් වීම.
3. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සලකා බලා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකිරීමෙන් පසු වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම. (ඇමුණුම 02 පරිදි)
4. ලියාපදිංචි සඳහා ව්‍යාජ ලියවිලි ඉදිරිපත් කරන අයදුම්කරුවන් සම්බන්ධයෙන් දැඩි නීතිමය පියවර ගැනීම.
5. වාහන ලියාපදිංචිය සඳහා අයදුම් කරන සියලු ආයතන, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශ පරිශ්‍රයේ සිට 15Km පමණ වන සීමාව තුල පිහිටා තිබීම.
6. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවූ පසු, වාර තුනකදී ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් නොකරන්නේ නම් ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් තාවකාලිකව ඉවත් කරනු ලැබේ. තවද පසුගිය අලුත්වැඩියාවන් සලකා බලා නැවත සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයේ ඇතුළත් කිරීමේ බලය වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය සතු බව.
7. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන නමුත්, අලුත්වැඩියා කටයුතු සිදුකිරීමේදී යම් වංචා සහගත ක්‍රියාවක හෝ යම් අක්‍රමිකතාවක යෙදුනු බවට හැඟී යන්නේ නම්, එවැනි සැපයුම්කරුවන් අසාදු ලේඛන ගතකර සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් නම ඉවත්කිරීමේ සම්පූර්ණ බලය වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය සතු බව.
8. ඔබ ආයතනය එකතුකළ අගය මත බදු (වැට්) සඳහා ලියාපදිංචි ආයතනයක් නම් ඒ වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ සහතිකය ඉදිරිපත් කිරීම.
9. එක් එක් සේවා අයතිමය සඳහා ප්‍රවීණත්වයක් තිබීම සහ ඊට අදාල විශේෂිත උපකරණ සතුවිය යුතුය.
10. වාහන ටින්කරින් සහ පින්තාරු කිරීම සඳහා Paint Booth පැවතීම අනිවාර්යය අවශ්‍යතාවයකි.
11. වාහන අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා වාහන ඔසවන (Jack) තිබිය යුතුය.
12. නවීන වාහන අලුත්වැඩියා කිරීම සඳහා වාහන Scan කිරීමේ පහසුකම් තිබිය යුතුය.
13. අලුත්වැඩියාව සඳහා ගතවන කාලය මිල ගණන් ලබාදීමේ දී සටහන් කළයුතු අතර එම එකඟ වන කාලසීමාව තුල වාහනය නියමිත පරිදි අලුත්වැඩියා කර නැවත භාරදීමට කටයුතු සිදුකළ යුතුය. යම් හෙයකින් ඊට වැඩි කාලයක් ගතවන්නේ නම් දීර්ඝ වන කාලය සඳහා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයෙන් අවසර ලබා ගත යුතුය. එසේ නොමැති නම් එකඟ වූ කාල සීමාවට වැඩිවන සෑම දිනකටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රමාද ගාස්තු අයකරනු ලැබේ.

**<u>අයදුම්පත් සම්පූර්ණ කිරීම හා ගාස්තු ගෙවීම</u>**

1. අයදුම්පත මිලිමීටර් 210X297 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, අංක 01 දිට 09 තෙක් ශීර්ෂ පළමු පිටුවේද, ඉතිරි ශීර්ෂ දෙවන පිටුවේ ද සටහන් වන පරිදි සකස් කළ යුතුය. එම තොරතුරු ඉදිරිපත් කිරීමේදී ව්‍යාපාර ලිපි ශීර්ෂය යටතේ ඉදිරිපත් කළ යුතුයි. එම ආකෘතිය වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියෙන් (www.trade.gov.lk) 2026.01.04 දින ප.ව. 2.00 දක්වා ලබාගත හැක.
2. 2026 වර්ෂය සඳහා මෙම කාර්යාලයේ සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වීමට, ලියාපදිංචි ගාස්තුව වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 2,500/- (දෙදහස් පන්සීය) ක මුදලක් ගෙවිය යුතුවේ.
3. ලියාපදිංචි ගාස්තු "වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය" නමින් ලංකා බැංකුවේ 0007042800 දරණ ගිණුමට බැර වන ලෙස ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් මුදල් ගෙවීම කළ හැක. එම ගෙවීම් සිදුකළ බව සනාථ කරගැනීම සඳහා බැංකුව විසින් ලබාදෙන ලදුපතේ මුල් පිටපත අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. එහිදී ලියාපදිංචි වන ආයතනයේ නමින් මුදල් තැන්පත් කළ යුතු අතර, ආයතනයේ නම ලදුපතේ සඳහන් වී තිබිය යුතුය. ලියාපදිංචිය සඳහා නියමිත පරිදි ලියවිලි ඉදිරිපත් කර නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලියාපදිංචි ගාස්තුව නැවත නොගෙවනු ලැබේ.
4. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ඉල්ලුම් කර ඇති අනෙකුත් ලියවිලි ද සමඟ 2026.01.05 දින ප.ව. 2.00 හෝ ඊට පෙර වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය, නො.492, ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ 03 යන ලිපිනයට (3 වන මහලේ ප්‍රවාහන අංශය වෙත) ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය.(තැපැලෙන් සිදුවන ප්‍රමාදයන් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් භාරගනු නොලැබේ.)
5. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම (වාහන අලුත්වැඩියා කටයුතු)" යනුවෙන් සඳහන් කළ යුතුය.
6. වැඩිදුර විමසීම් දුරකථන අංක 0112118669 මඟින් සිදුකළ හැක.

**සභාපති**

අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

කොළඹ 03.